# හම්බන්තොට ප්‍රාදේශීය සභාව
# හම්බන්තොට දිස්ත්‍රික්කය

## 1 මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 31 දිනට විගණනයට ඉදිරිපත් කළයුතු වුවත් , 2013 ඔක්තෝබර් 29 දින දක්වා ඉදිරිපත් කර නොතිබූ අතර ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන ද විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 1.2 ගනුදෙනු , මෙහෙයුම් හා කාර්ය සාධනය පිළිබඳව අදහස් දැක්වීම

#### 1.2.1 විගණනය සඳහා සාක්ෂි නොවීම

2013 ජූලි 18 දින දක්වා නිකුත් කරන තිබුණු විගණන විමසුම් 30 ක් සඳහා පිළිතුරු 2013 සැප්තැම්බර් 10 දින දක්වා ඉදිරිපත් කර නොතිබුණි. එකී විමසුම් වලට භාජනය වූ ගණුදෙනු වල ගණනය කළහැකි වටිනාකම රු. 52,775,071 ක් විය.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 ආදායම් පරිපාලනය

#### 2.1.1 පොළ බදු

2011 වර්ෂය සඳහා නව මයුරපුර සතිපොළ බදුගත් බදුකරු විසින් 2011 පෙබරවාරි 07 දින සිට 2011 පෙබරවාරි 28 දින දක්වා කාලයට අදාලව රු. 43,759 ක බදු මුදලක් ගෙවා නොතිබුණි.

#### 2.1.2 කඩකාමර කුලී

බැල්ලගස්වැව කඩකාමර 12 කින් අයවිය යුතු රු. 138,600 ක මුදලක් 2012 වර්ෂය අවසානයට හිඟව තිබූ අතර 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159 (1) වගන්තිය ප්‍රකාර හිඟ මුදල් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

2.1.3 බලපත්‍ර ගාස්තු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 151 වගන්තිය අනුව එක් ව්‍යාපාරික ස්ථානයක විවිධ වර්ගයේ වෙළඳාම් වෙනුවෙන් වෙන වෙනම බලපත්‍ර ගාස්තු අයකිරීමට ක්‍රියාකළ යුතු වුවත් එසේ කටයුතු කර නොතිබුණි.

2.2 නිෂ්ක්‍රීය හා ඌණ උපයෝජිත භෞතික සම්පත්

(අ) දීර්ඝකාලයක සිට නිෂ්ක්‍රීයව පවතින අංක 78-2040 දරන අත් ට්‍රැක්ටරය හා ජල බවුසරය 2003 ජනවාරි 03 දිනැති අංක 353 (5) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර අපහරණය කිරීම හෝ අලුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි.

(ආ) අංක NA – 5480 දරන අශෝක් ලේලන්ඩ් බස් රථය ජංගම පුස්තකාලයක් පවත්වාගෙන යාම සඳහා භාවිතා කර තිබූ අතර , දීර්ඝකාලයක සිට මෙම බස්රථය ප්‍රයෝජනයට නොගෙන කාර්යාල ගාල්කර පවතින බව නිරීක්ෂණය විය.

2.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

2.3.1 වාහන අලුත්වැඩියාව

(අ) වාහන අලුත්වැඩියාවන් වෙනුවෙන් රු. 96,245 ක මුදලක් ගෙවා තිබුණද ඒ සඳහා මෝටර් රථ පරීක්ෂකගේ පෙර / පසු වාර්තාවක් ලබාගෙන නොතිබුණි.

(ආ) රියදුරු ඉල්ලීමක් හා වගකිව යුතු නිලධාරියෙකුගේ නිර්දේශයක් රහිතව 227-5808 දරන කැබ් රථයට අමතර කොටස් මිළදී ගැනිම සඳහා 2012 අගෝස්තු 10 දිනැති අංක 737 වවුචරයෙන් රු. 16,762 ක් ගෙවා තිබුණු අතර මෙම මිළදී ගැනීම් ලොග් සටහන් පොතේද ඇතුළත් කර නොතිබුණි.

(ඇ) 252-6542 කැබ් රථයට අමතර කොටස් මිළදී ගැනීම සඳහා 2012 දෙසැම්බර් 05 දිනැති අංක 1011 වවුචරයෙන් රු. 276,300 ක මුදලක් යුනයිටඩ් මෝටර්ස් වෙත ගෙවා තිබුණි. මේ සඳහා පළාත් පාලන කොමසාරිස්ගේ අංක දපපා/ආ/05/06/පොදු හා 2010 අගෝස්තු 30 දිනැති ලිපිය අනුව පළාත් පාලන දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රික ඉංජිනේරුගේ වාර්තාව ලබාගෙන නොතිබුණි .

2.3.2 මිළගණන් කැඳවීමකින් තොරව මිළදී ගැනීම

2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.1 වගන්තිය ප්‍රකාර මිළ ගණන් කැඳවීමකින් තොරව අවස්ථා 08 කදී එකතුව රු. 959,947 ක මිළදී ගැනීම් සිදුකර තිබුණි.

2.3.3 වීථි පහන් මිළට ගැනීම

වීථි පහන් නඩත්තු කටයුතු සඳහා අවස්ථා දෙකකදී එකතුව රු. 227,535 ක් වටිනා වීථි පහන් හා උපාංග පෞද්ගලික ආයතනයක් වෙතින් මිළදී ගෙන තිබුණද 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.4 වගන්තිය ප්‍රකාර තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත්කර නිර්දේශ ලබාගෙන නොතිබුණි.

2.3.4 පොදු තැන්පත්

(අ) තැන්පත් ලේඛනය අනුව 2012 දෙසැම්බර් 31 දිනට රු. 3,856,912 ක් වූ කල් ඉකුත් වූ තැන්පත් තිබුණද , එකී තැන්පත් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 571 (3) ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

(ආ) 2011 හා 2012 වර්ෂ වලට අදාලව රු. 3,362,376 ක තැන්පත් ලැබීම් හා රු. 12,136,322 ක තැන්පත් ආපසු ගෙවීම් තැන්පත් ලේඛනයේ සටහන් කර නොතිබුණි.

2.3.5 බැංකු සැසඳුම්

(අ) සභාවේ පොදු ගිණුමට අදාලව සකස් කළ 2011 වර්ෂයේ දෙසැම්බර් බැංකු සැසඳුම අනුව දීර්ඝ කාලයක සිට ඉදිරියට එමින් පැවති එකතුව රු. 718,595 ක මුදල මුදල් පොතට ගැලපුම් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) නිකුත් කළ නමුත් ගිණුමට හර නොවූ කල් ඉකුත් වූ රු. 78,838 ක් වටිනා චෙක්පත් 20 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396(ඈ) ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

## 2.4 වත්කම් කළමනාකරණය

(අ) 1988 ප්‍රාදේශීය සභා (මුල්‍ය හා පරිපාලන) රීති 218 අනුව සභාවට අයත් ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ සමීක්ෂණයක් කර නොතිබූ අතර එම නිසා සභාවට අයත් ඉඩම් හා ගොඩනැගිලි නිසි ලෙස හඳුනා ගැනීමට නොහැකි වී ඇති බව නිරීක්ෂණය විය. ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් පීඑස් - 46 ආකෘතිය ප්‍රකාර ලේඛනයක් පවත්වා නොතිබුණි.

(ආ) 1988 ප්‍රාදේශීය සභා (මුල්‍ය හා පරිපාලන) රීති 203 හා 214 අනුව ඉන්වෙන්ට්‍රි භාණ්ඩ සමීක්ෂණයක් කළයුතු වුවත් , 2012 වර්ෂය සඳහා ඉන්වෙන්ට්‍රි භාණ්ඩ සමීක්ෂණය 2013 මාර්තු 15 දින දක්වාම සිදුකර නොතිබුණි.

## 2.5 ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම සහ අනවසර ඉදිකිරීම

(අ) 2011 වර්ෂය තුල ගොඩනැගිලි අයදුම්පත්‍ර 45 ක් සහ 2012 වර්ෂය තුල ගොඩනැගිලි අයදුම්පත්‍ර 16 ක් සැලසුම් කමිටුව විසින් අනුමත කර තිබු නමුත් ඉන් ඉදිකිරීම් නිමකරන ලද නිවාස හඳුනාගෙන ඒවා අනුමත සැලසුමකට අනුව ඉදිකර ඇති බවට අනුකූලතා සහතික නිකුත් කර තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය නොවුනි. ඒ අනුව නිමකරන ලද නව ඉදිකිරීම් වෙනුවෙන් වරිපනම් බදු තක්සේරු කර අයකර ගැනීමට ද නොහැකිව තිබුණි.

(ආ) 2012 වර්ෂය තුල සිදුකරනු ලැබූ අනවසර ඉදිකිරීම් වලට අදාල ලිපිගොනුව විගණනයට ඉදිරිපත් නොවුනි. 2013 වර්ෂයේ මාර්තු 15 දින වන විට මහජන පැමිණිලි අනුව අනවසර ඉදිකිරීම් 04 ක් වාර්තා වී තිබුණ අතර නාගරික සංවර්ධන අධිකාරිය විසින් අවස්ථා 03 කදී අනවසර ඉදිකිරීම් සිදුකරන ස්ථාන පිළිබඳව ලිඛිතව සභාවට දන්වා තිබුණි. මෙම අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 52 වගන්තියෙහි සඳහන් විධිවිධාන ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

## 2.6 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

සන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ පිළිසරු ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් 2011 දී රු. 512,639 ක් සහ 2013 වර්ෂයේදී රු. 304,320 ක මුදලක් ප්‍රාදේශීය සභාවට ලබාදී තිබුණ අතර , මෙම ඉදිකිරීම් සඳහා ගොවි සංවිධානයක් සමඟ 2012 ඔක්තෝබර් 16 දින ඇතිකරගත් ගිවිසුම පරිදි එකී ගොවි සංවිධානය විසින් ඉටුකර ඇති හා කාර්මික නිලධාරී

විසින් සහතික සහතික කරන ලද වැඩවල වටිනාකම සඳහා රු. 740,000 ක මුදලක් අදාල ගොවි සංවිධානය වෙත 2013 අප්‍රේල් 29 දින ගෙවීම් කර තිබුණි.

මධ්‍යම පරිසර අධිකාරියේ සභාපතිවරයා සමඟ ප්‍රාදේශීය සභාවේ සභාපති / ලේකම් ඇතිකරගත් ගිවිසුමට අනුව මෙම ව්‍යාපෘතියෙහි සියළු ඉදිකිරීම් 2012 පෙබරවාරි 29 දිනට අවසන් කළයුතුව තිබුණද, එකී දිනය නැවත 2013 අගෝස්තු 30 දින දක්වා දීර්ඝ කර තිබුණි. එසේ වුවද 2013 ජුනි 25 දින කරන ලද භෞතික පරීක්ෂාවේදී ඉදිකිරීම් කටයුතු නැවතී ඇති බවද අදාල භූමිය වල්බිහිව තිබූ බවද නිරීක්ෂණය විය.

2.7 කාර්ය සාධනය
-----------------

සභාව විසින් සංයුක්ත සැලැස්මක් හා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබූ අතර ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක්ද සිදුකර නොතිබුණි.

03. පද්ධති හා පාලන
-------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කළමනාකරණය